1

1.15 සංඛ්‍යා සටහන

**දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය**

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

| අයිතමය | 2021 | 2022 | 2023 | 2024 | 2025 (අ) |
|---|---|---|---|---|---|
| 1. රජයේ විදේශීය වත්කම් | 177 | 39 | 875 | 368 | 531 |
| 2. මහ බැංකුවේ විදේශීය වත්කම් | 2,962 | 1,858 | 3,517 | 5,754 | 6,307 |
| **3. දළ නිල සංචිත (1+2)** | **3,139** | **1,898** | **4,392** | **6,122** | **6,838** |
| 4. තැන්පතු භාර ගන්නා ආයතනවල විදේශීය වත්කම් | 2,983 | 3,976 | 4,981 | 5,108 | 5,467 |
| **5. මුළු විදේශීය වත්කම් (3+4) (ආ)** | **6,122** | **5,874** | **9,373** | **11,230** | **12,306** |
| 6. සංචිතවලට අදාළ වගකීම් (ඇ) | 3,562 | 5,127 | 4,796 | 3,635 | 2,553 |
| **7. ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6)** | **-423** | **-3,229** | **-404** | **2,487** | **4,285** |
| **8. සමස්ත ශේෂය (ඈ)** | **-3,967** | **-2,806** | **2,826** | **2,890** | **1,798** |
| 9. දළ නිල සංචිත මගින් වෙළඳ භාණ්ඩ ආනයන ආවරණය කළ හැකි මාස ගණන | 1.8 | 1.2 | 3.1 | 3.9 | 3.8 |
| 10. මුළු විදේශීය වත්කම් මගින් වෙළඳ භාණ්ඩ ආනයන ආවරණය කළ හැකි මාස ගණන | 3.6 | 3.9 | 6.7 | 7.2 | 6.9 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) 'විදේශයන්හි සිදු කරන ලද සෘජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.

(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (නොපියවා ඉතිරිව ඇති විශේෂ ගැනුම් හිමිකම් හැර)

(ඈ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස්වීම

බිලියන 6.8ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, ප්‍රධාන වශයෙන් ම ඉන්දියානු සංචිත බැංකුව සමඟ වූ විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකමට අදාළ ආපසු ගෙවීම් සහ 2016 වසරේ ජා.මූ. අරමුදලෙන් ලබා ගත් විස්තීර්ණ ණය පහසුකමට අදාළ ගෙවීම් හේතුවෙන් සංචිත ආශ්‍රිත වගකීම්, 2024 වසර අවසානයේ වූ එ.ජ. ඩොලර් බිලියන 3.6ක සිට 2025 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 2.6ක් දක්වා අඩු විය. ඒ අනුව, 2024 වසර අවසානයේ එ.ජ. ඩොලර් බිලියන 2.5ක් වූ ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වය, 2025 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 4.3ක් දක්වා වැඩි දියුණු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, සමස්ත ශේෂය, 2024 වසර අවසානයේ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 2.9ක අතිරික්තයට සාපේක්ෂව, 2025 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 1.8ක අතිරික්තයක් වාර්තා කළේය.

### 1.4.3 විදේශීය ණය සහ ණය සේවාකරණ ගෙවීම්

#### විදේශීය ණය

**2025 වසර තුළ දී මුහුණත වටිනාකමට අනුව ශ්‍රී ලංකාවේ මුළු විදේශීය ණය ප්‍රමාණය ඉහළ ගියේය.** මුහුණත වටිනාකමට අනුව, 2024 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 55.3ක් වූ මුළු විදේශීය ණය ප්‍රමාණය 2025 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 56.2ක් දක්වා වැඩි විය. මුහුණත වටිනාකම අනුව රජයේ විදේශීය ණය, 2024 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 35.6ක සිට 2025 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 36.7ක් දක්වා වැඩි විය. කෙසේවෙතත්, වෙළඳපොළ වටිනාකම අනුව රටෙහි මුළු විදේශීය ණය තත්ත්වය, 2025 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 54.8ක් දක්වා අඩු විය. ගනුදෙනු කළ හැකි ණය උපකරණ සඳහා වෙළඳපොළ වටිනාකම අනුව ප්‍රකාශයට පත් කෙරෙන රජයේ නොපියවා ඉතිරිව ඇති ණය තත්ත්වය, 2024 වසර අවසානයට පැවති එ.ජ. ඩොලර් බිලියන 35.6ක සිට 2025 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 35.4ක් දක්වා පහත වැටුණු අතර, එයට මූලිකව ම හේතු වූයේ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම පහත වැටීමයි. මේ අතර, මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය, 2024 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 4.9ක සිට 2025 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 3.9ක් දක්වා අඩු විය. මෙයට, ප්‍රධාන වශයෙන් ඉන්දියානු සංචිත බැංකුව සමඟ වූ විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම ක්‍රමයෙන් ආපසු ගෙවීම සහ 2016 වසරේ ලබාගත් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනට අදාළ ආපසු ගෙවීම් ද හේතු විය. මුදල් සහ තැන්පතු වගකීම් සහ නොපියවා ඉතිරිව ඇති ණය ඉහළ යෑම හේතුවෙන් බැංකු අංශයේ විදේශීය ණය ඉහළ ගියේය. සමස්තයක් ලෙස, 2024 වසර අවසානය වන විට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (වෙළෙඳපොළ වටිනාකමට අනුව) 55.4%ක් වූ රටෙහි විදේශීය ණය, 2025 වසර අවසානය වන විට 50.4%ක් දක්වා පහළ ගියේය.